වෙළෙඳ, වාණිජ හා අහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

# අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම

වෙළෙඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. අධ්‍යක්ෂ ජනරාල් තනතුර (HM2-1) (එක් තනතුරක්)

අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ පොදු මෙහෙයවීම සහ පාලනය යටතේ අධිකාරියේ සියලුම ක්‍රියාකාරකම්, පරිපාලන සහ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු සහ වගකිව යුතු වේ. ඔහු / ඇය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල කාර්යයන් සහ කටයුතු ක්‍රියාවෙහි යෙදවීම ක්‍රියාත්මක කිරීම ඉටුකළ යුතු අතර, රාජකාරිමය කාර්ය සාධනයෙන් විශිෂ්ඨත්වයට පත්වීම සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට නායකත්වය සහ අවශ්‍ය දිරිගැන්වීම ලබාදීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, අලෙවිකරණය, නීතිය, ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, වානිජ්‍යය, කෘෂිකර්මය හෝ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම. **සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Masters) සුදුසුකම සමග සුදුසුකම් ලබා ගැනීමෙන් පසු වසර 10ක පළපුරුද්ද සහිතව උපාධිය ලබා ගැනීමෙන් පසු සමස්ත වසර 18ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද තිබීම සහ එයින් වසර පහක් සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම. **හෝ**

පිළිගත් වෘත්තියවේදී ගණකාධිකරණ ආයතනයක අධි (Fellow) සාමාජිකයෙකු වීම සහ එම සුදුසුකම් ලැබීමෙන් පසුව ව්‍යාපාරික හෝ වාණිජමය පරිසරයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 18ක පළපුරුද්ද තිබීම සහ එයින් අවම වශයෙන් වසර පහක සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද තිබීම. **හෝ**

නීතිඥයෙකු වීම සමග සුදුසුකම් ලැබීමෙන් පසු ව්‍යාපාරික හෝ වාණිජමය පරිසරයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 18ක පළපුරුද්ද තිබීම සහ එයින් අවම වශයෙන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ අධ්‍යක්ෂ තනතුරක වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා :**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළවන පංතිය හෝ ඊට ඉහළ පංතිය නිලධාරීන් ද්විතීය පදනම මත අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කිරීමට හැකි බැවින් ඔවුන්ටද අයදුම් කළ හැකිය.

**වැටුප් පරිමාණය (HM 2-1/2016)** : රු. 93,020/- 12 x 2,700 = රු. 125,420/- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ප්‍රකාරව වයස අවුරුදු 40ට නොඅඩු සහ 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ප්‍රවාහන හා ඉන්ධන දීමනාව**

තිල වාහනයක් සමග රජයේ චක්‍රලේඛ වලට අනුකූලව ඉන්ධන දීමනාවක් ලබාගැනීමට හිමිකම් ලබයි.

**වෘත්තීය දීමනාව**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව වෘත්තීය දීමනාව ගෙවනු ලබයි.

**වෙනත් දීමනා**

වැටුපට අමතරව අදාළ දීමනා පවත්නා රජයේ චක්‍රලේඛ වලට අනුකූලව ගෙවනු ලබයි.

**පත්වීමේ ස්වභාවය**

මෙම තනතුර සේවක අර්ථසාධක අරමුදලෙහි (EPF), සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි (ETF) සහ රජයේ චක්‍රලේඛ ආදියෙහි විධිවිධාන ප්‍රකාරව අනෙකුත් හිමිකම් සහිත ස්ථිර තනතුරක් වේ. බඳවාගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර තුනක පරිවාස කාලයකට යටත් විය යුතුය.

**බඳවා ගැනීමේ පරිපාටිය**

පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

## වෙනත් සුදුසුකම්

ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

තෝරාගත් අයදුම්කරුවන් තම තනතුරට නියමිත රාජකාරී නිසි පරිදි ඉටු කිරීම සඳහා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

මෙම දැන්වීම පළවී දින 14ක් ඇතුළත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් තම අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ. තම සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික වල පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. සියලුම අයදුම්පත්‍ර විධිමත් සැලකිල්ලට ලක්කරනු ලබන අතර, කවර හෝ ආකාරයක උපකාර ලබා ගැනීමට උත්සාහ කිරීම නුසුදුසුකමක් සේ සලකා කටයුතු කරනු ලැබේ. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. ඉහත කරුණු සමග අනුගත නොවන අසම්පූර්ණ අයදුම්පත් සහ අවසාන දිනයට පසු යොමුවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම තනතුර ලබා ගැනීම සඳහා බලපෑම් කිරීම සුදුසුකම් නොලැබීමට හේතුවකි. ඔබ අයදුම් කරන තනතුරේ නම ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**ලේකම්**
**වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය, අංක 492, ආර්.ඒ. ද මැල් මාවත, කොළඹ 03.**
**2022.08.04**